# 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම

## (Recovery Plan for Learning Loss – 2022)

(6 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 13 ක් ද දෙවන හා තෙවන වාර වල කාලච්ඡේද 18 ක් ද බැගින් කාලච්ඡේද 49ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

# නර්තනය

## 6 ශ්‍රේණිය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

| තුන්වන වාරය | | | | | |
|---|---|---|---|---|---|
| **නිපුණතාව** | **නිපුණතා මට්ටම** | **අත්‍යාවශ්‍ය ඉගෙනුම් පල** | **විෂය අන්තර්ගතය** | **ක්‍රියාකාරකම** | **කාලච්ඡේද** |
| 1.0<br>පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ කරයි. | 1.4<br>ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් නර්තන නිර්මාණ කරයි. | • ලී කෙළි නැටුමේ සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.<br>• ලී කෙළි නැටුමට උචිත සරල පද නිර්මාණය කර අවකාශය හා රංග රටා මනා ලෙස යොදා ගනිමින් නැටුමක් ඉදිරිපත් කරයි.<br>• කණ්ඩායම් හැඟීමෙන් යුක්තව නර්තනය කරයි.<br>• ඉදිරිපත් කරන ලද නර්තන නිර්මාණ අගය කර අදහස් දක්වයි.<br>• තම නිර්මාණ පිළිබඳ අන්‍යන් දක්වන අදහස් ගරු කරයි. | • ලී කෙළි නැටුම හා සබැඳි සුවිශේෂී ලක්ෂණ හඳුනා ගනිමින් නර්තන නිර්මාණය | 1.4.2<br>ලී කෙළි නැටුමක් නිර්මාණය කරමු. | 04 |
| 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.4<br>නර්තනයේ දී සිරුර හසුරුවන ආකාරය විස්තර කරයි. | • අංග, ප්‍රත්‍යාංග, උපාංග නම් කර ඒවා නිවැරදිව හසුරුවන ආකාරය විස්තර කරයි.<br>• අංග, ප්‍රත්‍යාංග, උපාංග නිවැරදිව හසුරුවමින් නර්තන ඉදිරිපත් කරයි.<br>• නර්තනයේ චමත්කාරය දැනවීමට අංග, ප්‍රත්‍යාංග, උපාංගයන්හි සමායෝජනය වැදගත් බව ප්‍රකාශ කරයි. | • ශරීරාවබෝධය<br>• ශරීරයේ අංග, ප්‍රත්‍යාංග සහ උපාංග භාවිත වන අයුරු | 2.4.1<br>නර්තනයේදී සිරුර කෙසේ හසුරුවන්නේ දැයි විමසමු | 02 |
| 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.6<br>නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි. | • බෙර වාදනයට අනුව නිවැරදි නාදමාලාව අනුගමනය කරමින් අදාළ වන්නමේ කවි ගායනය කරයි.<br>• නියමිත තාල රූපයට අනුව නිවැරදි අංගහාර අනුගමනය කරමින් අලංකාර පද නිර්මාණය කරයි. | • හනුමා වන්නම/හනුමන්තා තාලය සින්දු වන්නම/ අනිලා වන්නම සම්පූර්ණයෙන් නැටීම | 2.6.1<br>වන්නම් ගයමින් නටමු | 04 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | • හනුමා වන්නම/හනුමන්තා තාලය සින්දු වන්නම/ අනිලා වන්නමට අදාළ කස්තිරම / ඉරට්ටිය / කලාසම තාල තබා කියයි.<br>• හනුමා වන්නම/හනුමන්තා තාලය සින්දු වන්නම/ අනිලා වන්නමට අදාළ කස්තිරම / ඉරට්ටිය / කලාසම නර්තනය කරයි.<br>• නිවැරදි අංගහාර අනුගමනය කරමින් බෙර වාදනයට අනුව ගයමින් වන්නම සම්පූර්ණයෙන් නර්තනය කරයි.<br>• සාමූහිකව හා ඒකල ව අභ්‍යාසයේ යෙදෙමින් කුසලතා වර්ධනය කරගනියි. | | | |
| 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.7<br>විධික්‍රම අනුගමනය කරමින් ප්‍රස්තාර කරයි. | • මූලධර්ම අනුගමනය කරමින් බෙර පද, කවි පද හා රබන් පද නියමිත තාල රූපවලට අනුව ප්‍රස්තාර කරයි.<br>• ප්‍රස්තාරකරණයේ දී නිවැරදි විධි ක්‍රම අනුගමනය කිරීම වැදගත් බව ප්‍රකාශ කරයි.<br>• තනි තිතේ ප්‍රභේද හඳුන්වයි. | • ප්‍රස්තාරකරණ විධි ක්‍රම තාලය,මාත්‍ර,ආඝාතය, විභාග, සංඥා, සලකුණු<br>• තනි තිතේ ප්‍රභේද (සුළු, මැදුම්, මහ මාත්‍රා 2, 3, 4)<br>• සුළු (2) මාත්‍රා තනි තිතට රබන් පද□ බෙර පද ණී ලී කෙළි□ වන්නම් ප්‍රස්තාර | 2.7.1<br>ප්‍රස්තාරකරණයේ යෙදෙමු. | 03 |
| 5.0<br>ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | 5.3<br>ශ්‍රී ලංකේය නර්තන සම්ප්‍රදාය ප්‍රවර්ධනයට දායක වූවන් අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි. | • නර්තනයේ ප්‍රවර්ධනයට දායකත්වය දැක්වූ ශිල්පීන් පිළිබඳව අගයමින් විස්තර කරයි.<br>• පරපුරෙන් පරපුරට දේශීය නර්තන සම්ප්‍රදායන් සුරැකීම සඳහා යෝජනා ඉදිරිපත් කරයි. | • නර්තන ශිල්පී නිත්තවෙල ගුණයා<br>• නර්තන ශිල්පී එන්.ඒ. සිරිබෝහාමි<br>• නර්තන ශිල්පී සව්රිස් සිල්වා | 5.3.1<br>නර්තනය ප්‍රවර්ධනයට දායක වූවන් අගයමු. | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 6.0<br>රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි. | 6.1<br>සබරගමු සමන් දේවාල පෙරහැර හා සබැඳි පසුබිම අධ්‍යයනය කරමින් එහි සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි. | • සබරගමු සමන් දේවාල පෙරහැර හා සබැඳි ඓතිහාසික පසුබිම විස්තර කරයි.<br>• පැවැත්වීමේ හේතු හා චාරිත්‍ර විධි නම් කරයි.<br>• පෙරහැරක දක්නට ලැබෙන නර්තන, ගායන අංග හා වෙනත් විශේෂාංග වෙන්කොට දක්වයි.<br>• පෙරහැර පිළිබඳ තොරතුරු රැස් කරයි.<br>• පෙරහැර සාමූහික සංස්කෘතික කලාංගයක් බව ප්‍රකාශ කරයි. | • සබරගමු සමන් දේවාල පෙරහැර<br>• ඓතිහාසික පසුබිම<br>• පැවැත්වීමේ හේතු<br>• චාරිත්‍ර විධි<br>• නර්තන, වාදන වෙනත් විශේෂාංග | 6.1.1<br>සමන් දේවාල පෙරහැර අසිරිය පවසමු | 03 |
| | | | | **තුන් වන වාරය කාලච්ඡේද එකතුව** | 18 |